සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
**Second Term Evaluation - 2016**

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | කතෝලික ධර්මය I පත්‍රය<br>கத்தோலிக்க சமயம் வினாத்தாள்-I<br>Catholicism Paper I | පැය එකයි<br>ஒரு மணித்தியாலம்<br>One Hour |

(01) "ප්‍රසාද ස්නාපනයේ මාර්ගයෙන් ඔබ ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය වූයෙහිය. බරපතල පාපයක් කිරීමෙන් ඒ සා මහත් සම්භාවනීය තැනැත්තෙකු ඔබේ හෘදයෙන් පළවා නොහරින්න " මෙම ප්‍රකාශය කරනු ලැබුවේ,

i. ශුද්ධ වූ අගුස්තීනු තුමා
ii. ශුද්ධවූ මහා ලියෝ ශුද්ධෝත්තම පියතුමා
iii. 12 වන පියුස් ශුද්ධෝත්තම පියතුමා
iv. ජෝන් ක්‍රිසොස්තම් තුමා

(02) පශ්චත්තාපයේ දේව ප්‍රසාද නිධානයේ ප්‍රධාන පරමාර්ථය හා ප්‍රතිඵලය

i. නැවත පව් නොකිරීමට ශක්තියයි
ii. දෙවියන් වහන්සේ සමග සමගි සන්ධානයට පැමිණීම
iii. තමා විසින් කළ වැරදි උදෙසා පශ්චත්තාප ක්‍රියා කිරීමයි
iv. අන් අයගේ ගැලවීම උදෙසා ක්‍රියා කිරීමයි

(03) නිල පූජකවරයේ ධූර වන්නේ,

i. රාජකීය , පූජක , දිවැසි
ii. රාජගුරු ප්‍රසාදි, පූජාප්‍රසාදි, තේවාචාරි
iii. පූජක , පැවිදි , ගිහි
iv. පූජක , රදගුරු , කාදිනල්

(04) විවාහයේ බාහිර සලකුණ වනුයේ

i. විවාහ වන යුවල මුදු හුවමාරු කර ගැනීම
ii. සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරියේ විවාහ වීමයි
iii. එකිනෙකාට ප්‍රකාශ කරන විවාහ පොරොන්දුවයි
iv. පියතුමා විසින් විවාහ වන යුවල ආසිරි ගැන්වීමයි

(05) " රන් අණ " ලෙස හැඳින්වෙන්නේ ,

i. අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමති ද , ඔබත් ඒ දේම ඔවුන්ට කරන්න
ii. මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න
iii. පළමුකොට දේවරාජ්‍යයද ධර්මිෂ්ඨකම ද සොයන්න. එවිට ඔබට සියල්ල දෙනු ලැබේ.
iv. ඉල්ලන්න ඔබට ලැබේ ,සොයන්න ඔබට සම්භ වේ.

(06) ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර ආරම්භ වන්නේ,

i. පාළුකරයේ යක්ෂයා විසින් පරීක්ෂා කිරීමෙන් පසුවය

ii. සිනගෝගයේ දේව වචනයේ පහදා දීමෙන් පසුවය

iii. කානා නුවර මඟුල් ගෙදර ජලය මිදි යුෂට හැරවීමෙන් පසුවය

iv. ජෝර්දාන් නදියේ බෞතිස්ම ස්නාපනයෙන් පසුවය.

(07) " මෙහෙසුරු දිවැසිවර " යනුවෙන් හඳුන්වන්නේ,

i. ස්නාවක ජුවාම් තුමාය

ii. ජේසුස් වහන්සේය

iii. එසකියෙල් දිවැසිවරයාය

iv. දිවැසිවර යෙසායාය

(08) සාමාන්‍ය එඬේරික ජිවිතයක් ගතකළ ඉශ්‍රායෙල් ජනතාව සුවිශේෂී දේව ජනතාවක් බවට පත්වන්නේ,

i. කල්වාරි ගිවිසුම නිසා

ii. සීනයි ගිවිසුම නිසාය

iii. ආබ්‍රහම් සමඟ ඇති වූ ගිවිසුම නිසාය

iv. ආදි මවුපියන් සමඟ ඇති වූ ගිවිසුම නිසාය.

(09) ජේසුස් වහන්සේ නව මෝසෙස් තුමා හා නව මෙසියානික ගුරුවරයා බව පෙන්වීම පරමාර්ථය කර ගනිමින් ශුභාරංචිය ලියනු ලැබුවේ

i. ශු . මතෙව් තුමා

ii. ශු. මාක් තුමා

iii. ශු . ලූක් තුමා

iv. ශු . ජොහාන් තුමා

(10) දේව අනාවරණයේ මූලාශ්‍ර වන්නේ,

i. ජීවන සභා සම්ප්‍රදාය , සභා පිය ඉගැන්වීම්

ii. සභා ප්‍රකාශන හා ශුද්ධවර ජීවිත

iii. ජීවන සභා සම්ප්‍රදාය, ශුද්ධ බයිබලය

iv. ක්‍රිස්තු ශුභාරංචිය, සභා සම්ප්‍රදාය

(11) සුභාරංචියේ හදවත වන්නේ,

i. මාංශගතවීමේ අභිරහස

ii. පාස්කු අභිරහස

iii. හෘද සාක්ෂිය

iv. ශුද්ධාත්ම ආගමනය

(12) "මනුෂ්‍ය පුත්‍රය, මේ පොත අනුභව කරගොස් ඉශ්‍රායෙල් වංශයට කතා කරන්න." මෙසේ කැඳවීම භාරදුන් දිවැසිවරයා වන්නේ

i. යෙසායා

ii. ජෙරමියා

iii. නාතාන්

iv. එසකියෙල්

(13) දෙවියන් වහනසේ සමඟ කළ ගිවිසුමට විශ්වාසවන්න වෙමින් එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළයුතු බවට උපදෙස් දෙන අනුශාසනාත්මක භාෂා ශෛලියක් ඇත්තේ ,

i. යාවේ සම්ප්‍රදායටය

ii. එලොහිම් සම්ප්‍රදායටය

iii. ද්විතිය නීති සම්ප්‍රදායටය

iv. පූජක සම්ප්‍රදායටය

(14) ශු. මහා ජාකොබ් තුමා ප්‍රාණ පරිත්‍යාගි වූයේ,

i. පිලිප්ගේ පාලන සමයේ
ii. හෙරෝද්ගේ ( අග්‍රි පා) පාලන සමයේ
iii. නිරෝගේ පාලන සමයේ
iv. සීසර්ගේ පාලන සමයේ

(15) දේශක දිවැසිවරු වන්නේ,

i. යෙසායා, ජෙරමියා, එසකියෙල්
ii. ස්නාවක ජුවාම්, යෙෂායා , නාකාන්
iii. එලිසා , එලීෂා , නාතාන්
iv. මීකා, ජොවෙල් , එලියා

(16) පුරාණ ගිවිසුමේ ඉතිහාස පොත් , ප්‍රඥා සාහිත්‍යය , දිවැසිවර ග්‍රන්ථ අනුපිළිවෙලින් සඳහන් වන්නේ,

i. ජොෂුවා, සිරාක්, සෙකරියා
ii. ප්‍රේම ගී. එස්රා, මලාකි
iii. ජෝබ්, විරාවලිය , මීකා
iv. බාරුක් , නාහුම්. ප්‍රඥාව

(17) ශු. බයිබලයේ එළිදරව් සාහිත්‍යයේ දේව ජනතාව ( ඉශ්‍රායෙලය ) සංකේතවත් කරන අංකය වන්නේ,

i. 4
ii. 12
iii. 7
iv. 10

(18) ජීවිතයේ හරය , එහි ගැටලු විනිශ්චය පිළිබඳ සංකල්පනා ආශ්‍රිතව කෙරෙන විග්‍රහයක් ඇතුළත් වන්නේ හෙබ්‍රව් ප්‍රඥාවේ කවර ප්‍රභේදයේද ?

i. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව
ii. රාජ්‍ය සභා ප්‍රඥාව
iii. එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව
iv. අභිධාර්මික ප්‍රඥාව

(19) ජේසුස් වහන්සේගේ මෘත ශරීරය කුරුසියෙන් බා , භූමදාන කටයුතු සිදු කිරීමට ඉදිරිපත් වන්නේ,

i. දමස්කස්හි අනනියස්
ii. ජෙරුසලමේ ස්තේපන්
iii. අරමාතියේ ජෝසෙප්
iv. ප්‍රධානියෙක් වූ නිකදේමුස්

(20) ශු . සභාව එක ජාතියකට , එක දේශයකට , එක ප්‍රදේශයකට සීමා නොවන බව ප්‍රකාශ කරන්නේ ශුද්ධ වූ සභාවේ ලක්ෂණයක් වන ,

i. සාධාරණත්වය මගිනි
ii. ශුද්ධත්වය මගිනි
iii. අපෝස්තලිකත්වය මගිනි
iv. ඒකත්වය මගිනි

(21) භාග්‍යවන්ත තෙරේසා මව්තුමියගේ බෞතිස්ම නාමය වන්නේ,

i. මාග්‍රට්
ii. සිසිලියා
iii. ඇග්නස්
iv. මරියා

(22) සාමාන්‍ය සමය තුළ සමරන වැදගත් මංගල්‍යයක් වන්නේ,

i. දේවමාතාවන් නිර්දෝෂව පිළිසිඳීමේ මංගල්‍යය
ii. ශුද්ධවූ පවුලේ මංගල්‍යය
iii. ශුද්ධවූ ත්‍රිත්වයේ මංගල්‍යය
iv. ශුද්ධාත්ම ආගමන මංගල්‍යය

(23) නව අහස හා නව පොළව ලෙස එළිදරව්ව පොතේ සදහන් වන්නේ,

i. ස්වර්ග රාජ්‍යය
ii. ශුද්ධ වූ සභාව
iii. විශ්වය
iv. සූර්යයා හා චන්ද්‍රයා

(24) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබද පුරාණ ගිවිසුමේ පූර්ව සලකුණු වන්නේ,

i. සහභාගිකමේ යාගය
ii. මෙල්කිසදෙක්ගේ යාගය
iii. සකරියස් තුමාගේ යාගය
iv. ඊසාක් තුමාගේ යාගය

(25) ජේසුස් වහන්සේගේ දවසේදී මනස්ථාපනය වීම පිළිබදව දැඩි අවශ්‍යතාවය ගැන ජනතාව විශේෂාකාර ලෙෂ සූදානම් කළේ

i. සිමියොන් දිවැසිවරයා
ii. ශුද්ධ වූ පේදුරු තුමා
iii. ශුද්ධ වූ පාවුළු තුමා
iv. ස්නාවක ජුවාම් තුමාය.

(26) ජුදෙව්වෝ නැඹුල් එල පුදා , දසපණත ලැබීම සිහිපත් කරනු ලැබුවේ,

i. පාස්කු මංගල්‍යයේදී
ii. කූඩාරම් මංගල්‍ය යේදී
iii. කැප කිරිමේ මංගල්‍යයේ දී
iv. පෙන්තකොස්ත මංගල්‍ය යේදී

(27) "ලිටුර්ජියා " යන්නෙහි අර්ථය

i. ජනවන්දනාව
ii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ
iii. පාස්කු අභිරහස
iv. සදාතන ජිවිතය

(28) ආබ්‍රහම් සමඟ ඇතිකරගත් ගිවිසුමේ බාහිර සලකුණ

i. ඊසාක් පූජා කිරිමයි
ii. චර්මඡේදනයයි
iii. මෙල්කිසෙදෙක්ගේ යාගයයි
iv. කානාන් දේශය වෙත ගමන් කිරිමයි

(29) "අබ්බා පියාණෙනි, ඔබට සියල්ලක්ම කළ හැකිය. මේ කුසලාන මා කෙරෙන් ඉවත් කළ මැනව. එහෙත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා " මෙම යාච්ඤාව අයත් වන්නේ ,

i. උත්තම පූජක යාච්ඤාවටය
ii. මල් උයනේ යාච්ඤාවටය
iii. අන්තිම රාත්‍රි භෝජනය අවස්ථාවේ කළ යාච්ඤාවටය
iv. ගොබ් ඉරුදින ජෙරුසලමේ කළ යාච්ඤාවටය

(30) දිව්‍ය පූජාවේ දී පුත්‍රයාණන් වහන්සේ මගින්, ශුද්ධාත්මයාණන් වහන්සේගේ සහභාගිකමෙන් , දෙවියන් වහන්සේ වෙත යොමුවන යාච්ඤාවක් වන්නේ,

i. පඩුරු මත යැදුමයි
ii. පොදු යැදුමයි
iii. ස්තෝත්‍ර යාගික යැදුමයි
iv. බොදුනෙත් පසු යැදුමයි

The National e-learning Portal for The General Education

(31) ජනවන්දනාවේ දී "සුදු" වර්ණය භාවිතා කිරීමේ අර්ථය

i. ඇදහිල්ලට සාක්ෂි දරීම, ගින්නෙහි , රුධිරයෙහි අරුත ගෙන දේ

ii. බලාපොරොත්තුව , නව ජීවනය සහ වර්ධනය අරුත ගෙන දේ

iii. පශ්චත්තාපය හා බලාපොරොත්තුවේ ලකුණකි

iv. ශුද්ධවත් බවේ, මහිමාන්විත බවේ , ආනන්දයේ අරුත ගෙන දේ.

(32) "නුඹේ පියාටද මවටද ගෞරව කරන්න. එවිට නුඹේ දෙවි සමිඳාණන් වහන්සේ නුඹට දෙන රටේ නුඹ බොහෝ කාලයක් ජීවත් වන්නෙහිය. " මෙම ශුද්ධ ලියවිලි පාඨය සඳහන් වන පොත

i. පාවුළු තුමා එපිසවරුන්ට ලියූ ලිපිය

ii. හිතෝපදේශය

iii. උපදේශකයා

iv. නික්මයාම

(33) "සහභාගිකමේ පූජා" යන නාමයට කියන තවත් නාමයක් වන්නේ ,

i. පාප පූජා

ii. සාම පූජා

iii. වන්දි ගෙවීමේ පූජා

iv. නොදවන පූජා

(34) තාපස දිවියේ පුරෝගාමීන් ලෙස සලකන්නේ,

i. ශුද්ධ වූ අන්තෝනි හා ශු. පාවුළු තුමන්ලාය

ii. ශුද්ධ වූ බෙනඩික් හා ජකෝමියස් තුමන්ලාය

iii. ශුද්ධ වූ බැසිල් හා අම්බ්‍රෝස් තුමන්ලාය.

iv. ශුද්ධවූ ජෙරොම් හා අගොස්තීනු තුමන්ලාය.

(35) දේව ජනතාව ගොඩනැගීම සඳහා ඊට නව සාමාජිකයන් බිහි කරන්නේ,

i. කිතුනු පාසල්

ii. කිතුනු පවුල

iii. මීසම් පවුල

iv. දෙව්සත්හල

(36) විශ්වාසය , බලාපොරොත්තුව , ප්‍රේමය දේව ධර්මගුණයන් වේ.

බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් වන්නේ,

i. යකුන්ගෙන් වැඩ ගැනීම හා අනුමානයය

ii. දෙවිකෙනෙක් නැතැයි සිතීම හා දේව අවිශ්වාසයය

iii. ඉච්ඡාභංගත්වය හා අනුමානයය

iv. යාච්ඤා අතපසු කිරීම හා ලෞකිකත්වය පසුපස යාමය

The National e-learning Portal for The General Education

(37) පාසල් අධ්‍යාපනය තුළ තිබූ කිතුනු ආගමික පරිසරය අහිමි කරමින්, පාසල් රජයට පවරා ගත්තේ ශ්‍රී ලාංකික සභා ඉතිහාසයේ

i. බ්‍රිතාන්‍ය යුගයේදී ය
ii. ලන්දේසි යුගයේදී ය
iii. පෘතුගීසි යුගයේදී ය
iv. නිදහසින් පසු යුගයේදී ය

(38) ශුද්ධවූ පාවුළු තුමා සමඟ බර්ණබස් තුමා හා ජොහාන් මාක් තුමා ධර්මදූත චාරිකාවට සහභාගි වූයේ,

i. පළමුවන ධර්මදූත ගමයේදී ය
ii. දෙවන ධර්මදූත ගමනේදීය
iii. තුන්වන ධර්මදූත ගමනේය.
iv. රෝමයට ගිය ගමනේදීය

(39) ශුද්ධ බයිබලයේ ග්‍රීක පිටපත හඳුන්වනුයේ,

i. මැසොරෙටික්
ii. වල්ගේට්
iii. සෙප්ටුවාජින්ත යනුවෙනි
iv. ඕතඩොක්ස්

(40) ආබ්‍රහම්, ඊසාක් , ජාකොබ් සමඟ දෙවියන් වහන්සේ ගිවිසුම් සබඳතාවය

i. අලුත් කළ සේක
ii. වෙනස් කළ සේක
iii. සම්පූර්ණ කළ සේක
iv. පූර්ණත්වයට පත්කළ සේක

( ලකුණු 2x20 = 40 )

e තක්සලාව අධ්‍යාපන The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | කතෝලික ආගම II පත්‍රය<br>கத்தோலிக்க சமயம் வினாத்தாள்-II<br>Catholicism Paper II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

(පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න )

(01) කෙටි පිළිතුරු සපයන්න.

1. පැවිදි ජීවිතයේ ලක්ෂණ 2ක් නම් කරන්න.
2. කිතුනු විවාහයේ ලක්ෂණ දෙක නම් කරන්න.
3. ප්‍රසාද ස්නාපනයේදී භාවිත වන සුදු වස්ත්‍රය හා පාස්කු ඉටිපහනේ අර්ථය කුමක්ද ?
4. යුක්තියට සාපිපාසා ඇත්තෝ භාග්‍යවන්තයෝය. ඔවුහු .........
5. මිනිසගේ උතුම්කම විද්‍යාමාන වන කරුණු 2 ක් නම් කරන්න.
6. දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් 2 නම් කරන්න.
7. කතෝලික සභාව පිළිගත් සභා 2 ක් නම් කරන්න.
8. ජුදා පාස්කු භෝජනයේ මූලාකාංග 2 ක් නම් කරන්න.
9. ශුද්ධ බයිබලයේ එළිදරව්වාදි ග්‍රන්ථ 2 ක් නම් කරන්න.
10. සිතින් හා ගතින් නිර්මලව සිටීමට අපට උගන්වන දේව පණත් 02 ලියන්න

( ලකුණු 2x10 = 20 )

(02) i. පැවිදි නිකායන් බෙදෙන කොටස් දෙක නම් කර, එකිනෙකට උදාහරණයක් බැගින් දෙන්න.

ii. පූජාප්‍රසාදි වහන්සේලා වෙනුවෙන් ගිහියන්ගේ යුතුකම් 3ක් ලියන්න.

iii. විවාහ ගිවිසුම දේව ප්‍රසාද නිධානයක් වන්නේ කවර අවස්ථාවකද යන්න දක්වා, සාර්ථක කතෝලික විවාහයක් සඳහා අවශ්‍ය වන කරුණු 5ක් ලියන්න.

( ලකුණු 2+3+5= 10 )

(03) i. දයාධික මනස්ථාපය හා භයාධික මනස්ථාපය අතර වෙනස දක්වන්න.

ii. ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන දේව වරප්‍රසාද 3ක් ලියන්න.

iii. අභිවෘද්දි ආලේපය ලැබූ යොවුන් වියේ ඔබට වර්තමාන සමාජය තුළ පැවරෙන වගකීම් 6ක් ලියන්න.

( ලකුණු 2+3+5= 10 )

(04) i. දේව රාජ්‍යය යන්න හඳුන්වන්න

ii. දේවරාජ්‍යයේ වර්ධනය සඳහා ජේසුස් වහන්සේ විසින් යවනු ලැබූ ශ්‍රාවකයන් 70 දෙනා වෙත ලබාදුන් උපදෙස් / අවවාද 3 ක් ලියන්න.

iii. පූර්ණත්‍යාගශීලි ජීවිතයකට කැපවූ (අ) ශුද්ධවූ දෙවන ජුවාම් පාවුළු මුනිතුමා (ආ) භාග්‍යවන්ත තෙරේසා මව්තුමිය කළ සේවා 3 බැගින් ලියන්න.

( ලකුණු 2+3+5= 10 )

(05) i. පුරාණ ගිවිසුමේ දී දෙවියන් වහන්සේ අනාවරණය වූ අවස්ථා 3 ක් නම් කරන්න.

ii. දස පණත පිළිගන්නා කිතුණු දරුවෙකු වන ඔබට එයින් ලැබෙන දේව අනාවරණ තුනක් ලියන්න.

iii. ලන්දේසි පීඩන සමයේ මෙරට සි ඔරතෝරියානු නිකායේ පියවරුන් ශ්‍රී ලාංකීය කිතුනු සභාව වර්ධනය කිරීමෙහිලා කරන ලද කර්තව්‍යයන් 5 ක් ලියන්න.

( ලකුණු 2+3+5= 10 )

(06) i. ජනවන්දනාවේ ප්‍රධාන අංග 2 ක් නම් කරන්න.

ii. ඔබ මීසම් පවුලේ ජනවන්දනා මෙහෙයන් අර්ථවත් කරගත හැකි ආකාර 3ක් ලියන්න.

iii. දිනපතා දේව වචනය අධ්‍යයනයෙන් ඔබ ලබන ප්‍රයෝජන 2ක් සඳහන් කර, දේව වචනයෙන් අන් අයගේ ද ජීවිත ආලෝකමත් කරන්නට ඔබ ගන්නා පියවර 3ක් දක්වන්න.

(07) කෙටි සටහන් ලියන්න. ( මාතෘකා 2ක් ගැන ) ( ලකුණු 2+3+5= 10 )

i. පරිසරය සුරැකීම පිළිබඳව කිතුනු කාර්යභාරය

ii. ගිහි ධර්මදූත සේවාවන්

iii. ස්නාවක ජුවාම් තුමාගේ දූත මෙහෙවර

iv. භාග්‍යයන් තුළින් දේව රාජ්‍යයේ වටිනාකම් කරා.....

( ලකුණු 2+3+5= 10 )